රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 12/2005 (III)

මගේ අංකය : EST-7/ INSURE/ 04/ 3500
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2012.02.09

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් සඳහා වූ</u>**
**<u>නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)</u>**

2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 කෙරේ ඔබේ අවධානය යොමු කරනු ලැබේ.

02. ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි 1 කොටස යටතේ වූ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයෙහි සඳහන් පවුල් ඒකකය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

විවාහක සේවකයන් :- සාමාජිකයා, කලත්‍රයා, රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වූවද, මුළුමනින්ම ආබාධිත වූ අවිවාහක හා සේවා වියුක්ත ළමුන්

03. අවුරුදු 21 ට වැඩි මුළුමනින්ම ආබාධිත තත්වයට පත්, අවිවාහක සේවා වියුක්ත දරුවන් සඳහා රෝහල් හා වෛද්‍ය ගාස්තු අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමට අදාලව එම දරුවාගේ ආසන්නම රෝගී කාල සීමාවට අදාළ වෛද්‍ය වර්තා, රෝග නිශ්චය කාඩ්පත් ආයතන ප්‍රධානියා විසින් සහතික කල යුතු අතර, එම දරුවා අවු: 21 ට වැඩි බවත් මුළුමනින්ම ආබාධිත, අවිවාහක හා සේවා වියුක්ත බවත් සහතික කළ යුතු වේ. එසේම එම දරුවා සම්බන්ධයෙන් ඉහත තොරතුරු සත්‍ය බවට අදාල ග්‍රාම නිලධාරී වෙතින් ලබාගත් සහතිකයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබා දිය යුතුය.

04. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.